**නිවාස, ඉදිකිරීම් හා ජලසම්පාදන අමාත්‍යාංශය**

**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය**

CIDA

**විද්‍යුත් තැපෑල : info@cida.gov.lk වෙබ් අඩවිය : www.cida.gov.lk**

# පුරප්පාඩු

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. සැපයුම් නිලධාරී - (JM 1-2) - II ශ්‍රේණිය

➢ **සුදුසුකම් සහ පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සැපයුම්දම කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය / ව්‍යාපාර කළමනාකරණය / ගිණුම්කරණය / මූල්‍ය කළමනාකරණය / වාණිජ්‍යය / විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.

**හෝ**

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ CIDA හි කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) (MA 1-2) - II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

## 2. නඩත්තු නිලධාරී - (JM 1-2) - II ශ්‍රේණිය

➢ **සුදුසුකම් සහ පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2 හෝ 3)**

1. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් ලබාගත් අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 07 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.
2. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් ලබා ගත් අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 06 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම හා සුදුසුකම ලැබීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට පිළිගත හැකි පුද්ගලික අංශයේ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 05 ක පළපුරුද්ද ලබා තිබීම.
3. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් ලබා ගත් අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 05 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ සුදුසුකම ලැබීමෙන් රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට පිළිගත හැකි පුද්ගලික අංශයේ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 10 ක සේවා පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ ක්ෂේත්‍රයේ CIDA හි කළමනාකරණ සහකාර (තාක්ෂණික) (MA 2-2) - II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

## 3. ගිණුම් නිලධාරී - (JM 1-2) - II ශ්‍රේණිය

➢ **සුදුසුකම් සහ පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූල්‍ය / ගිණුම්කරණය / වාණිජ්‍යය / ගිණුම්කරණය හා මූල්‍ය කළමනාකරණය / ව්‍යාපාර පරිපාලනය / රාජ්‍ය පරිපාලනය / රාජ්‍ය කළමනාකරණ හෝ කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම

**හෝ**

2. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) අන්තර් මධ්‍ය විභාගය හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) / සහතිකලත් ගණකාධිකාරීන්ගේ සංගමයේ (ACCA) I සහ II කාණ්ඩයේ විභාග සමත් වීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.

**හෝ**

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ CIDA හි කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) (MA 1-2) - II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් අවුරුදු පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

ලිඛිත තරඟ විභාගය සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

**වැටුප් කේතය සහ මාසික වැටුප් පරිමාණය :**

**කනිෂ්ඨ කළමනාකරු මට්ටම - JM 1-2 - 2025: රු. (74,010/- 10X1,360/- 18X2,040/- 124,330/-)**

(බාහිරව බඳවා ගන්නා අයදුම්කරුවන්ගේ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ ස්ථානගත කරනු ලැබේ. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව, ආරම්භක වැටුප් පියවරේ ගෙවනු ලබන වැටුප රු. 66,781/- වන අතර, 2027.01.01 දින සිට ගෙවනු ලබන වැටුප රු. 74,010/- වේ.)

**සෑම අයදුම්කරුවෙකුම,**

i ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

ii. තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව සුදුසු විය යුතුය.

iii. විශිෂ්ට චරිතයකින් හා ජවයකින් හෙබි විය යුතු ය.

**වයස් සීමාව :**

- අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන්ට සහ දැනටමත් රජයේ / ව්‍යස්ථාපිත ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන්ට ඉහත සඳහන් උපරිම වයස් සීමාවන් අදාළ නොවේ.

**වෙනත් ප්‍රතිලාභ**

❖ රජය විසින් අනුමත කරන ලද ජීවන වියදම් දීමනාව සහ අනෙකුත් දීමනා.

❖ සේවකයාගේ වැටුප් පදනම් කොටගෙන සේවක අර්ථසාධක අරමුදලට ආයතනයෙන් 15% ක දායකවීමක් ද,සේවකයාගෙන් 10% ක දායකවීමක් ද සමග ආයතනය විසින් සේවකයා වෙනුවෙන් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට 3% ක් ද බැර කිරීමක් කරනු ලැබේ.

❖ "අග්‍රහාර රන්" වෛද්‍ය රක්ෂණ පහසුකම් ආයතනය විසින් ලබා දෙනු ලැබේ.

❖ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ මඟින් කලින් කලට සංශෝධනය කරනු ලබන ආකාරයට ප්‍රසාද දීමනා හා ඉතිරි කරගත් වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ගෙවනු ලැබේ.

**අයදුම් කරන ආකාරය :**

**"අයදුම්පත් ආකෘති" CIDA වෙබ් අඩවියෙන් (www.cida.gov.lk) බාගත කළ හැක.**

අයදුම්කරුගේ ජීව දත්ත ඇතුළත්ව, නිසි පරිදි පිළියෙල කරන ලද අයදුම්පත්, අධ්‍යාපන හා වෘත්තීය, පළපුරුද්ද පිළිබඳ සහතික කරන ලද සහතික පිටපත් සමග ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනය වෙත 2026 මාර්තු 19 දින හෝ ඊට පෙර ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සභාපති වෙත ලැබීමට සැලැස්විය යුතුය. රාජ්‍ය දෙපාර්තමේන්තු / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල / ආයතනවල සේවය කරන අයදුම්කරුවන්ගේ අයදුම්පත්, තම දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන්ගේ නිර්දේශයන් සහිතව, ඔවුන් තෝරා ගත හොත් දැනට දරන තනතුරින් නිදහස් කිරීමට හැකිද යන්න සඳහන් කර එවිය යුතු ය. අයදුම්පත් එවීමේදී ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ තමා අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කර එවිය යුතු ය.

*අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. සුදුසුකම් සපුරා ඇති තෝරා ගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.*

**සභාපති,**
**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය,**
**"සව්සිරිපාය", 123, විජේරාම මාවත,**
**කොළඹ 07.**